*සැ. යු.* — 2014.08.29 දින පළ වූ අංක 1,878 දරන ගැසට් පත්‍රයේ III  කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,879 - 2014 සැප්තැම්බර් මස 05 වැනි සිකුරාදා - 2014.09.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1070 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1076 | අයවැය ලේඛන ... ... ... | 1082 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.* - නගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත 2014 අගෝස්තු මස 01 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 සැප්තැම්බර් මස 26 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 සැප්තැම්බර් මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1069 - B 80872— 2,875 (2014/09 )
F 1 –

## තනතුරු ඇබෑර්තු

### මාතර මහ නගර සභාව

මාතර මහ නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අවම අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | 4 | රා.ප.ච. 6/2006 (iv) අනුව PL 1 -2006 A වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම. |
| ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය | 4 | රා.ප.ච. 6/2006 (iv) අනුව PL 1- 2006 A වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම. |

*පොදු සුදුසුකම් :*

(i) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය ;

(ii) අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය. පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතුය;

:(iii) සෑම අපේක්ෂකයකු ම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය;

(iv) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුයි;

(v) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.

.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරා ගනු ලබන අතර, එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු පදනම් කර ගනිමින් බඳවා ගැනීම සිදු කරනු ලැබේ;

(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය;

(ii) වැන්දඹු හා අනත්දරු අරමුදලට දායකත්වය හිමි වේ;

(iii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම, හා හැසිරීම යහපත් තත්ත්වයේ සිටින සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ. එමෙන්ම වසර තුනක සේවා කාලය අවසන් වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය;

(iv) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජන රජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙළ කරන ලද අයදුම්පතක් 2014.09.20 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "නාගරික කොමසාරිස්, මහ නගර සභාව, මාතර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ඉල්ලුම් කරනු ලබන තනතුර" සඳහන් කළ යුතුයි. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම පූර්ණ බලතල මාතර මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ.

අයදුම්පත සමග පහත සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි.

(i) උප්පැන්න සහතිකය,

(ii) අධ්‍යාපන සහතික,

(iii) පදිංචිය සහතික කිරීම පිණිස මෑතක දී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය, (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය),
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්,
(v) පළපුරුද්ද පිළිබඳ සහතික,
(vi) මාතර මහ නගර සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්.

සේනක පල්ලියගුරුගේ,
නාගරික කොමසාරිස්,
මහ නගර සභාව - මාතර.

2014 අගෝස්තු මස 14 වැනි දින,
මහ නගර සභාව -මාතර.

මාතර මහ නගර සභාව

**.......................................තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. අයදුම්කරුගේ නම (මුල'කුරු සමග) :—————.
2. මුල'කුරුවලින් හැඳින්වෙන නම් :—————.
3. තැපැල් ලිපිනය :—————.
4. දුරකථන අංකය :—————.
5. උපන් දිනය :
   වර්ෂය :—————. මාසය :—————. දිනය :—————.
6. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු :—————. මාස :—————. දින :—————.
8. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
9. විවාහක/අවිවාහක බව :—————.
10. ජාතිය :—————.
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :—————.
12. අධ්‍යාපන සුදුසුකම් :—————.
13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :—————.
14. ඔබ දැනටමත් මාතර මහ නගර සභාවේ සේවය කරන්නේ නම් :—————.
    (i) දැනට දරන තනතුර :—————.
    (ii) එම තනතුරට පත් වූ දිනය :—————.
    (iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් :—————.
    ඇස්තමේන්තුගත පදනම මත ද) :—————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරැදි වූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

09-25/1

---

**මාතර මහ නගර සභාව**

මාතර මහ නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අවම අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| මෝටර් කාර්මික III ශ්‍රේණිය | 1 | රා.ප.ච. 6/2006 (iv) අනුව PL 2 -2006 A වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයක් (06) සමත්වී තිබිය යුතුය.<br>අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (N.V.Q) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබිය යුතු ය.<br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ. |
| පින්තාරුකරු (වාහන) III ශ්‍රේණිය | 1 | රා.ප. ච. 6/2006A (iv) අනුව PL -2-2006A වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතුය.<br>අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (N.V.Q) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබිය යුතු ය.<br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ. |
| ආදාහනාගාර ක්‍රියාකරු III ශ්‍රේණිය | 1 | රා.ප.ච. 6/2006 (iv) අනුව PL 2-2006 A වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතු ය.<br>අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (N.V.Q) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබිය යුතු ය.<br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ. |

*පොදු සුදුසුකම් :*

(i) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතු ය ;

(ii) අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය. පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතු ය;

(iii) සෑම අපේක්ෂකයකුම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය ;

(iv) ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතු යි;

(v) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලබන අතර, එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු පදනම් කර ගනිමින් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය ;

(ii) වැන්දඹු හා අනන්දරු අරමුදලට දායකත්වය හිමි වේ;

(iii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම සහ හැසිරීම යහපත් තත්ත්වයේ සිටින සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ. එමෙන්ම වසර තුනක සේවා කාලය අවසන් වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය;

(iv) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතු ය.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පතක් 2014.09.20 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "නාගරික කොමසාරිස්, මහ නගර සභාව මාතර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුයි. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල මාතර මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ.

අයදුම්පත සමඟ පහත සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි.

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතික,
(iii) පදිංචිය සහතික කිරීම පිණිස මෑතක දී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය. (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතු ය),
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්,
(v) පළපුරුද්ද පිළිබඳ සහතික,
(vi) මාතර මහ නගර සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්.

සේනක පල්ලියගුරුගේ,
නාගරික කොමසාරිස්,
මහ නගර සභාව - මාතර.

2014 ක් වූ අගෝස්තු මස 14 වැනි දින,
මහ නගර සභාව - මාතර.

මාතර මහ නගර සභාව

**.......................................තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. අයදුම්කරුගේ නම (මුල'කුරු සමග) :————.
2. මුල'කුරුවලින් හැඳින්වෙන නම් :————.
3. තැපැල් ලිපිනය :————.
4. දුරකථන අංකය :————.
5. උපන් දිනය :
   වර්ෂය :————. මාසය :————. දිනය :————.
6. ජාතික හැඳුනුම්පත් අංකය :————.
7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :
   අවුරුදු :————. මාස :————. දින :————.
8. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
9. විවාහක/අවිවාහක බව :————.
10. ජාතිය :————.
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :————.
12. අධ්‍යාපන සුදුසුකම් :————.
13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :————.
14. ඔබ දැනටමත් මාතර මහ නගර සභාවේ සේවය කරන්නේ නම් :————.
    (i) දැනට දරන තනතුර :————.
    (ii) එම තනතුරට පත් වූ දිනය :————.
    (iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්) :————.
    ඇස්තමේන්තුගත පදනම මත ද) :————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරැදි වූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

09-25/2

## කැළණිය ප්‍රාදේශීය සභාව

2013 දෙසැම්බර් මස 27 වැනි දින *ගැසට් පත්‍රයෙහි* iv(ආ) වැනි කොටසෙහි (පළාත් පාලන) තනතුරුවලට බඳවා ගැනීම සඳහා පළ කරන ලද *ගැසට් නිවේදනය* අවලංගු කරමි. 2014.07.01 වැනි දින සිට කැළණිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති මෙම නිවේදනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය (මාසික)* | *අවම අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | රියදුරු II 'ආ' | 01 | රු.12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු.18,860 (රා.ප.ච. 06/2006) (iv හි (PL3-2006 A) | *පොදු සුදුසුකම් :*<br>1. ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය,<br>2. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය,<br>3. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න යේ වූ වසර 03 ක කාලය තුළ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචියක් තිබිය යුතුය,<br>4. තනතුර සඳහා ඉල්ලුම්පත්‍රය භාර ගැනීමේ අවසාන දිනය ඇතුළත මාසයේ සිට පූර්වාසන්න මාසයේ අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය,<br>5. රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.<br><br>*අධ්‍යාපන සුදුසුකම් :*<br>1. දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වීම,<br>(එක් වරක දී අවම වශයෙන් විෂයයන් 05 ක් සමත්ව තිබිය යුතුය.)<br><br>*වෙනත් සුදුසුකම් :*<br>1. පෞද්ගලික කුලී රථ සහ තාර බර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබිය යුතුය. (බඳවා ගන්නා දිනට වසර 03 කට පෙර අදාළ සහතිකය ලබා තිබිය යුතුය.),<br>2. දෙපාර්තමේන්තුවේ එක් නියෝජිතයෙකු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් වාහන පරීක්ෂකවරයෙකු හා පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකුගෙන්ද සමන්විත මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ පරීක්ෂණයකින් සමත් විය යුතුය. |
| 02 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 02 | රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 රා. ප. ච. 06/2006 (iv) හි (PL 1-2006 A) | *පොදු සුදුසුකම් :*<br>1. ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.<br>2. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය,<br>3. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න යේ වූ වසර 3 ක කාලය තුළ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචියක් තිබිය යුතුය,<br>4. තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය භාර ගැනීමේ අවසාන දිනය ඇතුළත මාසයේ සිට පූර්වාසන්න මාසයේ අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය,<br>5. රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.<br><br>*අධ්‍යාපන සුදුසුකම් :*<br>අවම වශයෙන් 5 වැනි ශ්‍රේණිය/6 වසර සමත්ව තිබීම. |

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය,
2. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ,
3. මෙම බඳවා ගැනීම් ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජයේ හෝ පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියාකිරීමට සියලු සේවකයින් බැඳී සිටිය යුතුය,
4. සේවයට බැඳුනු භාෂාවට අතිරේක වශයෙන් අනෙක් භාෂාව පිළිබඳව ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 05 ක් ඇතුළත ලබාගත යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

1. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 අනුව ලිඛිත/වෘත්තීය හෝ සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුස්සන් තෝරා ගැනේ.
2. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය. මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.
   - (i) උප්පැන්න සහතිකය,
   - (ii) අධ්‍යාපන සහතික,
   - (iii) තම පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,
   - (iv) මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරී වෙතින් ලබාගත් එකක් විය යුතුය.),
   - (v) වෘත්තීය පුහුණුවක් හෝ පළපුරුද්දක් තිබේ නම් එම සහතික (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින්) ඉදිරිපත් කළ යුතුය.

3. මූලික සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*අයදුම්පත් එවීම :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2014.09.25 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ “ලේකම්, කැළණිය ප්‍රාදේශීය සභාව, බුළුගහ හන්දිය කැළණිය” යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "අයදුම් කරන තනතුර" පැහැදිලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර හෝ මෙම බඳවාගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලතල කැළණිය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සතුවේ.

එච්. එම්. එන්. කුමාරි,
ලේකම්,
කැළණිය ප්‍රාදේශීය සභාව.

2014 ක්වූ අගෝස්තු මස 15 වැනි දින,
කැළණිය ප්‍රාදේශීය සභාවේ දී ය.

කැළණිය ප්‍රාදේශීය සභාව - කැළණිය

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ................................................... තනතුර සඳහා බඳවා ගැනීම**

1. මුලකුරු සමග නම :——————.
2. මුලකුරු වලින් හැඳින්වෙන නම්:——————.
3. ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කය:——————.
4. ස්ථිර ලිපිනය:——————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය:——————.
6. විවාහක/අවිවාහක බව:——————.
7. උපන් දිනය :
   අවුරුදු:——————. මාස :——————. දින :——————.
8. 2014.01.01 වැනි දිනට වයස :
   අවුරුදු :——————. මාස :——————. දින:——————.
9. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද/ලියාපදිංචියෙන්ද යන වග:——————.
10. ජාතික හැඳුනුම්පත් අංකය:——————.
11. අධ්‍යාපන සුදුසුකම්:
    - (i) සමත් වූ වසර/ශ්‍රේණිය :——————.
    - (ii) අ.පො.ස.(ස. පෙළ) විභාගය:——————.
      විභාග අංකය:——————. වර්ෂය:——————. මාසය:——————.

*සමත් වූ විෂයයන් :*

| | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|
| i. | ........................................ | ........................................ |
| ii. | ........................................ | ........................................ |
| iii. | ........................................ | ........................................ |
| iv. | ........................................ | ........................................ |
| v. | ........................................ | ........................................ |
| vi. | ........................................ | ........................................ |
| vii. | ........................................ | ........................................ |
| viii. | ........................................ | ........................................ |
| ix. | ........................................ | ........................................ |
| x. | ........................................ | ........................................ |

12. වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුය.) :————————.
13. සේවා පළපුරුද්ද:————————.
14. ඔබ කෙදිනක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?:————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බව ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර මා නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසුව ඒ බව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බව දනිමි.

————————.
අයදුම්කරුගේ අත්සන

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා :*

*ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම ඉල්ලුම්කරු වන........................................................ මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ... ........................................................ වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :————————.

පදවි නාමය:————————.

දෙපාර්තමේන්තුව/ආයතනය:————————.
(නිල මුද්‍රාව යොදන්න)

දිනය:————————.

09-41

# පළාත් පාලන නිවේදන

**රාජාංගනය ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වන වගන්තිය සමග කියවුතු සුසාන භූමි සහ මිනී පිටි ආඥාපනතේ 03 වැනි වගන්තිය යටතේ රාජාංගනය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2013.09.26 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ජී. එච්. සරත් ගාමිණී මයා,
සභාපති,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

2014 අගෝස්තු මස 04 වැනි දින,
රාජාංගනය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### සුසාන භූමි පවරා ගැනීමේ යෝජනාව

රාජාංගනය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් සුසාන භූමි රාජාංගනය ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම පිළිබඳව විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු ගැසට් පත්‍රයේ පළ වූ දිනයේ සිට දින 14ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කිරීමට බලය තිබෙන බවත් එකී කාලය තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවේ නම් එකී සුසාන භූමි ප්‍රාදේශීය සභාව සතු සුසාන භූමි වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බවත් පොදු ජනතාවගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරමි.

**රාජංගනය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සුසාන භූමි**

01. රාජාංගනය යාය 18 සුසාන භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | අංක 318,317,316 ඉඩම් කට්ටි |
| දකුණ | - | අංක 376 ඉඩම |
| නැගෙනහිර | - | අංක 874 ඉඩම |
| බටහිරට | - | අංක 374 පනංකානි ඇල |

භූමි ප්‍රමාණය අක්කර 02

02. රාජාංගනය යාය 17 සුසාන භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | හේමසිරි මහතාගේ හා කපිල රත්නායක මහතාගේ ඉඩම |
| දකුණ | - | ආර්. එම්. උපාලි රත්නායක මහතාගේ ඉඩම |
| නැගෙනහිර | - | පාර රක්ෂිතය |
| බටහිරට | - | තම්මැන්නා වැව |

භූමි ප්‍රමාණය අක්කර 02

03. රාජාංගනය යාය 16 සුසාන භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | පාර රක්ෂිතය |
| දකුණ | - | චූලනී මහතාගේ කුඹුර |
| නැගෙනහිර | - | ටී. වී. ධර්මදාස මහතාගේ ඉඩම |
| බටහිරට | - | දර්ශන මහතාගේ ඉඩම |

භූමි ප්‍රමාණය අක්කර 1/2

04. රාජාංගනය යාය 15 සුසාන භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | මාර්ග රක්ෂිතය |
| දකුණ | - | මාර්ග රක්ෂිතය |
| නැගෙනහිර | - | ආර්. එම්. එස්. උදේශිකා මහත්මියගේ ඉඩම |
| බටහිරට | - | එල්. චන්ද්‍රපාල මහතාගේ ඉඩම |

භූමි ප්‍රමාණය අක්කර 05

05. රාජාංගනය යාය 15 සුසාන භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | මාර්ග රක්ෂිතය |
| දකුණ | - | ලලිත් ආනන්ද මහතාගේ ඉඩම |
| නැගෙනහිර | - | කුසලා මහත්මියගේ ඉඩම |
| බටහිරට | - | මාර්ග රක්ෂිතය |

භූමි ප්‍රමාණය අක්කර 01

06. රාජාංගනය යාය 07 සුසාන භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | මාර්ග රක්ෂිතය |
| දකුණ | - | පාර රක්ෂිතය |
| නැගෙනහිර | - | කුණු ඇල රක්ෂිතය |
| බටහිරට | - | සමගි අවමංගල්‍යාධාර සමිතිය |

භූමි ප්‍රමාණය අක්කර 03

07. රාජාංගනය යාය 06 සුසාන භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | විජය මහතාගේ ඉඩම |
| දකුණ | - | ඩී. එම්. ආරියරත්න බණ්ඩාර මහතාගේ ඉඩම |
| නැගෙනහිර | - | පාර රක්ෂිතය |
| බටහිරට | - | බටුගුනේ මහතාගේ ඉඩම |

භූමි ප්‍රමාණය අක්කර 03

08. රාජාංගනය යාය 14 සුසාන භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | කේ. රණසිංහ මහතාගේ හා ප්‍රේමදාස මහතාගේ ඉඩම |
| දකුණ | - | එච්. කේ. මල්ලිකා මහත්මියගේ ඉඩම |
| නැගෙනහිර | - | එච්. කේ. මල්ලිකා මහත්මියගේ ඉඩම |
| බටහිරට | - | පියසිරි සමන් මහතාගේ ඉඩම |

භූමි ප්‍රමාණය අක්කර 01

09. රාජාංගනය යාය 13 සුසාන භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | බහුකාර්ය ගොඩනැගිල්ල, ඉන්දිකා මහතාගේ ඉඩම |
| දකුණ | - | මාර්ග රක්ෂිතය |
| නැගෙනහිර | - | මාර්ග රක්ෂිතය |
| බටහිරට | - | ජී. පී. එස්. මාර්ග රක්ෂිතය |

භූමි ප්‍රමාණය අක්කර 02

10. රාජාංගනය යාය 10 සුසාන භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | රුහුණු අවමංගල්‍යාධාර සමිතිය |
| දකුණ | - | එච්. පී, මල්ලිකා ගුණසීලි මහත්මියගේ ඉඩම |
| නැගෙනහිර | - | කමල් මහතාගේ ඉඩම |
| බටහිරට | - | මාර්ග රක්ෂිතය |

භූමි ප්‍රමාණය අක්කර 142

11. රාජාංගනය යාය 09 සුසාන භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | ජී. පී. එස්. පැරණි ඉඩම් රක්ෂිතය |
| දකුණ | - | චූලේ, මුදලාලි, යූ. සෙනෙවිරත්න යන අයගේ ඉඩම |
| නැගෙනහිර | - | යාය 09 විහාරස්ථානය |
| බටහිරට | - | එච්. එම්. මල්ලිකා මහත්මියගේ ඉඩම |

භූමි ප්‍රමාණය අක්කර 05

12. රාජාංගනය යාය 11 සුසාන භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | කුඹුරු ඇල රක්ෂිතය |
| දකුණ | - | මාර්ග රක්ෂිතය |
| නැගෙනහිර | - | කුරටියා වැව් වාන් ඇළ |
| බටහිරට | - | මාර්ග රක්ෂිතය |

භූමි ප්‍රමාණය අක්කර 07

13. රාජාංගනය යාය 08 සුසාන භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | කුණු ඇල රක්ෂිතය |
| දකුණ | - | මෛත්‍රී රත්න මහතාගේ හා ඩබ්. ජී. ජයසේන මහතාගේ ඉඩම |
| නැගෙනහිර | - | කුණු ඇල රක්ෂිතය |
| බටහිරට | - | කුණු ඇළ රක්ෂිතය |

භූමි ප්‍රමාණය අක්කර 06

14. රාජාංගනය යාය 04 සුසාන භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | අනුලා මහත්මියගේ නිවස හා ඇල රක්ෂිතය |
| දකුණ | - | මාර්ග රක්ෂිතය |
| නැගෙනහිර | - | මාර්ග රක්ෂිතය |
| බටහිරට | - | ධර්මෙ මහතාගේ ඉඩම |

භූමි ප්‍රමාණය අක්කර 01

15. රාජාංගනය යාය 05 සුසාන භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | එම්. එච්. චන්ද්‍රසේන තිසේරා මහතාගේ ඉඩම |
| දකුණ | - | මාර්ග රක්ෂිතය |
| නැගෙනහිර | - | ඩබ්. එච්. සුමිත් සුසන්ත මහතාගේ ඉඩම |
| බටහිරට | - | මාර්ග රක්ෂිතය |

භූමි ප්‍රමාණය අක්කර 02

16. රාජාංගනය යාය නවගම්මාන සුසාන භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | කුඹුරු රක්ෂිතය |
| දකුණ | - | මාර්ග රක්ෂිතය |
| නැගෙනහිර | - | මාර්ග රක්ෂිතය |
| බටහිරට | - | ඇළ රක්ෂිතය |

භූමි ප්‍රමාණය අක්කර 02

17. රාජාංගනය කළුන්දෑගම සුසාන භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | ඇළ රක්ෂිතය |
| දකුණ | - | මාර්ග රක්ෂිතය |
| නැගෙනහිර | - | මාර්ග රක්ෂිතය |
| බටහිර | - | මාර්ග රක්ෂිතය |

භූමි ප්‍රමාණය අක්කර 02

18. රාජාංගනය සිරිමාපුර සුසාන භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | කුඹුරු රක්ෂිතය |
| දකුණ | - | කුඹුරු රක්ෂිතය |
| නැගෙනහිර | - | සනී මහතාගේ ඉඩම |
| බටහිර | - | පාර රක්ෂිතය |

භූමි ප්‍රමාණය අක්කර 02

19. රාජාංගනය යාය 02 සුසාන භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | මාර්ග රක්ෂිතය |
| දකුණ | - | කරුණා මහතාගේ ඉඩම |
| නැගෙනහිර | - | මාර්ග රක්ෂිතය |
| බටහිර | - | යාය 01 කුඹුරු රක්ෂිතය |

භූමි ප්‍රමාණය අක්කර 02

09-23

---

## රාජාංගනය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රීඩා භූමි

රාජාංගනය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 108 වැනි පොදු උපයෝගීතා යටතේ ක්‍රීඩා භූමි රාජාංගනය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2013.09.26 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ජී. එච්. සරත් ගාමිණී මයා,
සභාපති,
රාජාංගනය ප්‍රාදේශීය සභාව.

2014 අගෝස්තු මස 04 වැනි දින,
රාජාංගනය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### ක්‍රීඩා භූමි පවරා ගැනීමේ යෝජනාව

රාජාංගනය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් ක්‍රීඩා භූමි රාජාංගනය ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම පිළිබඳව විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු ගැසට් පත්‍රයේ පළ වූ දිනයේ සිට දින 14ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කිරීමට බලය තිබෙන බවත් එකී කාලය තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවේ නම් එකී ක්‍රීඩා භූමි ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩා භූමි වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බවත් පොදු ජනතාවගේ දැනගැනීම පිනිස මෙයින් ප්‍රසිද්ධ කරමි.

01. රාජාංගනය යාය 16 ක්‍රීඩා භූමිය රන්තරු ක්‍රීඩා සමාජය

| | | |
|---|---|---|
| උතුර | - | කේ. ඒ. අනුර කුමාරගේ ඉඩම |
| දකුණ | - | ඇල සමග පාර රක්ෂිතය |
| නැගෙනහිර | - | එන්. පී. නිලන්තගේ ඉඩම |
| බටහිරට | - | එච්. පී. ප්‍රසාන්තගේ ඉඩම |

භූමි ප්‍රමාණය අක්කර 03

02. රාජාංගනය යාය 16 නාමල් සෙවනගම ක්‍රීඩා භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | සමන් කුමාර දිසානායක, විජේරත්න යන අයගේ ඉඩම |
| දකුණ | - | ප්‍රජා ශාලාව |
| නැගෙනහිර | - | රක්ෂිත හේන් ඉඩම |
| බටහිරට | - | පාර රක්ෂිතය |

භූමි ප්‍රමාණය අක්කර 01

03. රාජාංගනය යාය 15 විමුක්ති ක්‍රීඩා භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | මාර්ග රක්ෂිතය |
| දකුණ | - | මාර්ග රක්ෂිතය |
| නැගෙනහිර | - | මාර්ග රක්ෂිතයඩ |
| බටහිරට | - | මාර්ග රක්ෂිතය |

භූමි ප්‍රමාණය අක්කර 01

04. රාජාංගනය යාය 06 දියවර ගම්මාන ක්‍රීඩා භූමිය අකලන්ක ක්‍රීඩා සමාජය

| | | |
|---|---|---|
| උතුර | - | අනුර බණ්ඩා මහතාගේ ඉඩම |
| දකුණ | - | මාර්ග රක්ෂිතය |
| නැගෙනහිර | - | මාර්ග රක්ෂිතය |
| බටහිරට | - | මාර්ග රක්ෂිතය |

භූමි ප්‍රමාණය අක්කර 02

05. රාජාංගනය යාය 14 ක්‍රීඩා භූමිය

| | | |
|---|---|---|
| උතුර | - | මාර්ග රක්ෂිතය |
| දකුණ | - | ඩබ්. ලීලාරත්නගේ ඉඩම |
| නැගෙනහිර | - | මාර්ග රක්ෂිතය |
| බටහිරට | - | සුනිල් ආනන්ද මහතාගේ හා එම්. පී. ස්ටීවන් මහතාගේ ඉඩම |

භූමි ප්‍රමාණය අක්කර 1/2

06. රාජාංගනය යාය 13 සුචරිත අවමංගල්‍යාධාර සමිතිය අසල ක්‍රීඩා භූමිය සුදු පරවි ක්‍රීඩා සමාජය

උතුර - මාර්ග රක්ෂිතය
දකුණ - මාර්ග රක්ෂිතය
නැගෙනහිර - මාර්ග රක්ෂිතය
බටහිරට - සාදා මහතාගේ ඉඩම
භූමි ප්‍රමාණය අක්කර 02

07. රාජාංගනය යාය 13 ක්‍රීඩා භූමිය ජයසිකුරු ක්‍රීඩා සමාජය

උතුර - මාර්ග රක්ෂිතය
දකුණ - ජස්ටින් මහතාගේ හා නිහාල් ජයන්ත මහතාගේ ඉඩම
නැගෙනහිර - මාර්ග රක්ෂිතය
බටහිරට - මාර්ග රක්ෂිතය
භූමි ප්‍රමාණය අක්කර 02

08. රාජාංගනය යාය 11 පුබුදු ක්‍රීඩා භූමිය

උතුර - ලාල් මහතාගේ ඉඩම
දකුණ - මාර්ග රක්ෂිතය
නැගෙනහිර - ඩී, සී. කේ ලියනගේ මහතාගේ ඉඩම
බටහිරට - මාර්ග රක්ෂිතය
භූමි ප්‍රමාණය අක්කර 1/2

09. රාජාංගනය යාය 04 ක්‍රීඩා භූමිය

උතුර - රාජු, ශාන්ත, අජිත් යන අයගේ ඉඩම්
දකුණ - මාර්ග රක්ෂිතය
නැගෙනහිර - මාර්ග රක්ෂිතය
බටහිරට - මාර්ග රක්ෂිතය
භූමි ප්‍රමාණය අක්කර 07

10. රාජාංගනය නව ගම්මාන ක්‍රීඩා භූමිය බුලට් ක්‍රීඩාංගනය

උතුර - මාර්ග රක්ෂිතය
දකුණ - මාර්ග රක්ෂිතය
නැගෙනහිර - ඥාණදාස මහගාගේ හා චන්ද්‍රපාල මහතාගේ ඉඩම
බටහිරට - මාර්ග රක්ෂිතය
භූමි ප්‍රමාණය අක්කර 02

11. රාජාංගනය කළුන්දෑගම ක්‍රීඩා භූමිය එවරස්ට් ක්‍රීඩා සමාජය

උතුර - ආනන්ද විජේසිංහ මහතාගේ ඉඩම
දකුණ - මාර්ග රක්ෂිතය
නැගෙනහිර - මාර්ග රක්ෂිතය
බටහිරට - විල්සන් මහතාගේ ඉඩම
භූමි ප්‍රමාණය අක්කර 02

12. රාජාංගනය සිරිමාපුර ක්‍රීඩා භූමිය

උතුර - මාර්ග රක්ෂිතය
දකුණ - මාර්ග රක්ෂිතය
නැගෙනහිර - මාර්ග රක්ෂිතය
බටහිරට - ඇල රක්ෂිතය
භූමි ප්‍රමාණය අක්කර 02

13. රාජාංගනය නවසිරිගම ක්‍රීඩා භූමිය රන්තරු ක්‍රීඩා සමාජය

උතුර - මාර්ග රක්ෂිතය
දකුණ - එච්. එම්. සෝමාවතී මහත්මියගේ ඉඩම
නැගෙනහිර - හියුබට් මහතාගේ ඉඩම
බටහිරට - ඥානවතී මහත්මියගේ ඉඩම
භූමි ප්‍රමාණය අක්කර 02

14. රාජාංගනය යාය 02 ක්‍රීඩා භූමිය රතු රෝස ක්‍රීඩා සමාජය

උතුර - මාර්ග රක්ෂිතය
දකුණ - මාර්ග රක්ෂිතය
නැගෙනහිර - මාර්ග රක්ෂිතය
බටහිරට - ලියනගේ තේමිස් සිංඤෝ මහතාගේ ඉඩම
භූමි ප්‍රමාණය අක්කර 02

15. රාජාංගනය යාය 18 ආරාමය අසල ක්‍රීඩා භූමිය

උතුර - ආරාමය පිහිටි ඉඩම
දකුණ - මාර්ග රක්ෂිතය
නැගෙනහිර - මාර්ග රක්ෂිතය
බටහිරට - ගොඩ ඉඩම
භූමි ප්‍රමාණය අක්කර 02

16. සිරිමාපුර වොලිබෝල් ක්‍රීඩා පිටිය

උතුර - මාර්ග රක්ෂිතය
දකුණ - ප්‍රජා ශාලාව
නැගෙනහිර - ගොඩ ඉඩම
බටහිරට - මාර්ග රක්ෂිතය
භූමි ප්‍රමාණය අක්කර 1/2

17. යාය 08 ක්‍රීඩා පිටිය

උතුර - ගොඩ ඉඩම
දකුණ - පාසල් ක්‍රීඩා පිටිය
නැගෙනහිර - පාසල් ක්‍රීඩා පිටිය
බටහිරට - මාර්ග රක්ෂිතය
භූමි ප්‍රමාණය අක්කර 02

09-24

## අරණායක ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24(2) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය ප්‍රකාර සබරගමුව පළාතේ, කෑගලු දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය සභාව විසින් මෙහි අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති මංමාවත/මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් /මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොදා ඇති මෙම මංමාවත/මංමාවත් සම්බන්ධයෙන් අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් යම් විරුද්ධත්වයක් පල කරනු ලබන්නේ නම් මේ නිවේදනයේ දින සිට තුන් මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 17 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මංමාවත/මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් /මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරන බව, පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ආර්. දිනේෂ් ගුණරත්න,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
අරණායක.

*මාර්ගයේ නම* :- වහරක්ගොඩ නාගහමුලතැන්න මාර්ගය

*මාර්ගයේ ආරම්භය සහ අවසානය* :- අරණායක පාරේ වහරක්ගොඩ උතුවන්කන්ද මාර්ගයේ මධ්‍යයේ සිට ඒ. ඩබ්. ජී. යසෝ මැණිකේ මහත්මියගේ නිවස අසලින් ගල් අමුණ ඇළ දක්වා

*ග්‍රාම සේවා වසම හා අංකය* :- 17 සී වහරක්ගොඩ

*මාර්ගයේ දිග හා පළල* :- මීටර් 407, අඩි 12

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම්

| | | | |
|---|---|---|---|
| 1. | ආර්. පී. විජේරත්න මයා | - | මුදුනේපිට හේන ඉඩම |
| 2. | ආර්. ජී. ඩී. රාජමන්ත්‍රී මයා | - | මුදුනේපිට හේන ඉඩම |
| 3. | ඩී. එච්. එන්. ආරියරත්න මයා | - | මුදුනේපිට හේන ඉඩම |
| 4. | එච්. ජී. වීරසේන මයා | - | මුදුනේපිට හේන ඉඩම |
| 5. | එම්. අයි. කේ. පියරත්න මයා | - | උඩවත්ත ඉඩම |
| 6. | එන්. ඩබ්. සුමනාවතී මිය | - | උඩවත්ත ඉඩම |
| 7. | බී. ජී. විජේවර්ධන මිය | - | හිටිනාවත්ත ඉඩම |
| 8. | එන්. ඩබ්. එල්. හද්‍රා අමරකාන්ති මිය | - | හිටිනාවත්ත ඉඩම |
| 9. | ආර්. ජී. තිලකරත්න මයා | - | ඉඹුල්ගහවත්ත ඉඩම |
| 10. | එම්. අයි. කේ. පියරත්න මයා | - | නාගහමුලතැන්න ඉඩම |
| 11. | ආර්. ජී. ලයනල් මයා | - | කෝපිවත්ත ඉඩම |
| 12. | ඩබ්. එම්. පුෂ්පලතා මිය | - | කිරිපොලේ කුඹුර ඉඩම |

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම්

| | | | |
|---|---|---|---|
| 1. | ඒ. ඩබ්. ඩී. ජී. යසෝමැණිකේ මිය | - | සිත්තරගෙවත්ත ඉඩම |
| 2. | යූ, ඒ. කුමාරසිරි මයා | - | සිත්තරගෙවත්ත ඉඩම |
| 3. | කේ. ඒ. සුනිල් ශාන්ත ජයසිංහ මහතා | - | තලගහමුලවත්ත ඉඩම |
| 4. | ජී එච්. ජී. සී. ප්‍රේමවංශ මහතා | - | තලගහමුලවත්ත ඉඩම |
| 5. | ජී, එච්. ලීලාවතී මිය | - | හිටිනාවත්ත ඉඩම |
| 6. | බී. ජී. සෝමතිලක මයා | - | හිටිනාවත්ත ඉඩම |
| 7. | බී, ජී. විජේවර්ධන මයා | - | හිටිනාවත්ත ඉඩම |
| 8. | ආර්. ජී. අබේරත්න මයා | - | මීගහවත්ත ඉඩම |
| 9. | ඩබ්. එම්. ජී, වීරකෝන් මයා | - | නාගහමුල තැන්න ඉඩම |
| 10. | පී, ජී, ආර්. කේ. එස්. බණ්ඩාර මයා | - | නාගහමුල තැන්න ඉඩම |
| 11. | ඩබ්. එම්. ජී. වීරකෝන් මයා | - | නාගහමුල තැන්න ඉඩම |
| 12. | එම්. අයි. කේ. පියරත්න මයා | - | නාගහමුල තැන්න ඉඩම |
| 13. | ජී. ජී. සෙනවිරත්න මයා | - | නාගහමුල තැන්න ඉඩම |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මහතාගේ 2014.02.08 දිනැති අංක 50/2014 දරන පිඹුරු පත පරිදියි.

*මාර්ගයේ නම* :- පැහිනිපැද්දර මුත්තෙට්ටුහේන හරහා මා ඔයට යන මාර්ගය

*මාර්ගයේ ආරම්භය සහ අවසානය* :- පැහිනිපැද්දර පන්සල අසල පාලම අසල සිට මුත්තෙට්ටුවේ හේන දක්වා මාර්ගය.

*ග්‍රාම සේවා වසම හා අංකය* :- 45 සී පැහිනිපැද්දර

*මාර්ගයේ දිග හා පළල* :- මීටර් 238, අඩි 08

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම්

| | | | |
|---|---|---|---|
| 1. | ඊ. පී. ජයතිලක මයා | - | කොස්ගහමුලහේන දෙනිය ඉඩම |
| 2. | ඊ. පී. කුලරත්න මයා | - | අගලකොටුව ඉඩම |
| 3. | එස්. පී. බිලිඳු මයා | - | අගලකොටුව ඉඩම |
| 4. | ඩී. පී. අජිත් කුමාර මයා | - | දෙහිගහමුලහේන ඉඩම |
| 5. | ඩබ්. පී. රණසිංහ මයා | - | දෙහිගහමුලහේන ඉඩම |
| 6. | ඩබ්. පී. ගුණතිලක මයා | - | දෙහිගහමුලහේන ඉඩම |
| 7. | පී. සී. ක්‍රිස්ටා මයා | - | දෙහිගහමුලහේන ඉඩම |
| 8. | ඩබ්. පී. ජයසේන මයා | - | දෙහිගහමුලහේන ඉඩම |

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම්

| | | | |
|---|---|---|---|
| 1. | ඩී. මහින්ද භාරතී හිමි | - | බෝමළුවේ හේන ඉඩම |
| 2. | එම්. පී. ගුණසේන මයා | - | බෝමළුවේ හේන ඉඩම |
| 3. | එල්. විමලදාස මයා | - | තේ වත්ත ඉඩම |
| 4. | ඊ. පී. සෝමලතා මිය | - | බෝගහමුලහේන ඉඩම |
| 5. | ඩබ්. පී. රණසිංහ මයා | - | මත්තෙට්ටුවේ හේන ඉඩම |
| 6. | ඩබ්. පී. ප්‍රේමදාස මයා | - | මත්තෙට්ටුවේ හේන ඉඩම |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මහතාගේ 2014.02.08 දිනැති අංක 43/2014 දරන පිඹුරුපත පරිදියි.

09-26

---

**වැලිගම ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 හා 24(2) වැනි වගන්තිය යටතේ සිදු කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තියේ ප්‍රකාර දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි පහත උපලේඛනයේ සඳහන් මාර්ගය 2013.10.29 මාසික සභාවේ තීරණ අංක 4.3 යටතේ යෝජනා ස්ථිරත්වයෙන් සම්මත විය. 2002.05.19 දින මැන අඳින ලද අංක 405 දරන පිඹුරේ දැක්වෙන පරිදි එම මාර්ගය වැලිගම ප්‍රාදේශීය සභාව සතු මාවතක් ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ.

පුෂ්පකුමාර බැට්ටගේ,
සභාපති,
වැලිගම ප්‍රාදේශීය සභාව.

| *පාරේ නම* | *දිග* | *පළල* | *වම් පස ඉඩමේ නම* | *දකුණුපස ඉඩමේ නම* |
|---|---|---|---|---|
| කොස්ගහහේන මාවත | මීටර් 50 | මීටර් 3.6 | කොස්ගහහේන | කොස්ගහහේන |
| | | | 04 කැබැල්ල | 03 කැබැල්ල |
| | | | 10 කැබැල්ල | 11 කැබැල්ල |
| | | | | 12 කැබැල්ල |

09-138

**වැලිගම ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 හා 24(2) වැනි වගන්තිය යටතේ සිදු කරනු ලබන දැන්වීමයි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තියේ ප්‍රකාර දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ පිහිටි වැලිගම ප්‍රාදේශීය සභාව සතු මෙම මාර්ගය 2014.06.17 මාසික සභාවේ තීරණ අංක 4.4.1 යටතේ යෝජනා ස්ථිරත්වයෙන් සම්මත විය. පහත උපලේඛනයේ සඳහන් මාර්ගය වැලිගම ප්‍රාදේශීය සභාව සතු මාවතක් ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් සලකුණු කොට ඇති මෙම මංමාවත සම්බන්ධයෙන් අදාළ ඉඩම් වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනයේ සිට එක් මසක් ඇතුළත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

පුෂ්පකුමාර බැට්ටගේ,
සභාපති,
වැලිගම ප්‍රාදේශීය සභාව.

2014 අගෝස්තු මස 18 වැනි දින,

| *පාරේ නම* | *දිග* | *පළල* | *වම් පස ඉඩමේ නම* | *දකුණු පස ඉඩමේ නම* |
|---|---|---|---|---|
| විලේ කුඹුර මාර්ගය | මීටර් 335 | මීටර් 4.8 | *කිරිනුගවත්ත* | *කිරිනුගවත්ත* |
| | | | 23 කැබැල්ල | 25 කැබැල්ල |
| | | | 24 කැබැල්ල | 19 කැබැල්ල |
| | | | 20 කැබැල්ල | 16,17 කැබැල්ල |
| | | | ඇල | 6 කැබැල්ල |
| | | | 06 කැබැල්ල | 5 කැබැල්ල |
| | | | විලේ කුඹුර | පරගහකුඹුර |
| | | | විලේ කුඹුර | |

09-137

---

# අයවැය ලේඛන

**මහනුවර මහ නගර සභාව**

2014 පරිපූරක අයවැය ලේඛනය අංක 01

මහනගර සභා ආඥා පනතේ 214-2 (ආ) වගන්තිය ප්‍රකාරව 2014 මුදල් වර්ෂය සඳහා වූ මහනුවර මහනගර සභාවේ පරිපූරක අංක 01 අයවැය ලේඛනය 2014 සැප්තැම්බර් මස 01 වැනි දින සිට දින හතක (07) ක කාලයක් මහජනතාවට පරීක්ෂා කර බැලීම සඳහා පහත සඳහන් ස්ථානවල තබා ඇති බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. මහනගර සභා ගරු මන්ත්‍රීවරුන්ගේ නිල කාමරය - මහ නගර සභාව මහනුවර,
2. මහනුවර නාගරික කොමසාරිස් කාර්යාලය,
3. මහනුවර නාගරික ප්‍රධාන ගණකාධිකාරි කාර්යාලය,
4. ඩී. එස්. සේනානායක අනුස්මරණ මහජන පුස්තකාලය, මහනුවර.

ටී. මහින්ද්‍ර රත්වත්තේ,
නගරාධිපති,
මහනුවර මහ නගර සභාව.

2014 අගෝස්තු මස 20 වැනි දින,
මහනුවර මහ නගර සභා කාර්යාලයේ දී ය.

09-505

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු. ශ.* |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2014** | | | | | |
| සැප්තැම්බර් | 2014.09.05 | සිකුරාදා | 2014.08.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.09.12 | සිකුරාදා | 2014.08.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.09.19 | සිකුරාදා | 2014.09.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.09.26 | සිකුරාදා | 2014.09.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2014.10.03 | සිකුරාදා | 2014.09.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.10.10 | සිකුරාදා | 2014.09.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.10.17 | සිකුරාදා | 2014.10.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.10.24 | සිකුරාදා | 2014.10.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.10.31 | සිකුරාදා | 2014.10.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2014.11.07 | සිකුරාදා | 2014.10.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.11.14 | සිකුරාදා | 2014.10.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.11.21 | සිකුරාදා | 2014.11.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.11.28 | සිකුරාදා | 2014.11.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.